**ශීර්ෂය 245 - රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජනවාරි 05 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව අග්‍රිම ගිණුමේ ශේෂය රු. 1,045,734 වී තිබුණත්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ එම ශේෂය දක්වා නොතිබුණි. එමෙන්ම2019 දෙසැම්බර් 31 දින භාණ්ඩාගාරයට පියවා තිබුණත්, භාණ්ඩාගාර වෙත ප්‍රේෂණය නොවූ රු. 1,045,734 ක මුදල් ශේෂය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මුදල් හා මුදල් වලට සමාන දෑ ලෙස දක්වා නොතිබුණි. | 2019 දෙසැම්බර් 31 දිනැති අංක 271/2019 දරණ රාජ්‍ය ගිණුමේ චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල සඳහන් සංඛ්‍යා භාණ්ඩාගාර පොත් අනුව සසඳා ඉදිරිපත් කල යුතු වීම. | රු. 1,045,734 ක මුදල 2019 දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ අවසාන ශේෂය බවත් එදිනට මුදල් පොත පියවා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට යොමු කර ඇති අතර ඒ අනුව මුදල් පොතේ ශේෂය රු. 00.00 වේ. |

### 1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී තැන්පතු ලැබීම් රු.20,604ක් හා තැන්පතු ගෙවීම් රු.20,604 ක් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි. | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුමේ චක්‍රලේඛයේ සඳහන් ආකෘතිය පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතු වීම. | තැන්පතු ගිණුමේ ලැබීම් හා ගෙවීම් දෙපසෙහිම වටිනාකම රු.20,604 ක් වන අතර එයින් ජනිත වන වටිනාකම ශුන්‍ය අගයක් ගන්නා බවද, මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ අතපසුවීමකින් එය පෙන්නුම් කර නොමැති බවද ඉදිරියේදී මෙවැනි අතපසුවීම් සිදු නොවීමට කටයුතු කරන බව. |

**1.6.3 අක් මුදල් ගැලපුම් ගිණුම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණනයට ඉදිරිපත් කර තිබුණු අක් මුදල් ගැලැපුම් ගිණුමේ බැර පැත්තේ එකතුව ලෙස රු.2,466,461 ක් දක්වා තිබුණද එහි එකතුව රු. 2,692,984 ක් බව නිරීක්ෂණය විය. | අක්මුදල් ගැලපුම් ගිණුම නිවැරදිව සකස් කළ යුතුවීම. | විගණන නිරීක්ෂණය හා එකඟ වෙමි. යතුරුලියනය කිරීමේදී සිදුවූ දෝෂයක් බවත්, ඉදිරියේදී එසේ නොවීමට වගබලා ගන්නා බව. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේදී මූලධන වැය විෂයයන් 2 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.400,000 ක ප්‍රතිපාදනවලින් කිසිදු උපයෝජනයක් නොකර එම ප්‍රතිපාදන මුළුමණින්ම ඉතිරි කර තිබුණි. | ප්‍රතිපාදන උපයෝජනය කාර්යක්ෂමව සිදුකළ යුතුවීම. | ජාතික අයවැය චක්‍රලේඛ 04/2019, 05/2019 හා 07/2019 මගින් රාජ්‍ය වියදම් සීමා කිරීම හේතුවෙන් ඉතා හදිසියෙන් කළ යුතු නොවන විශාල අළුත්වැඩියාවන් සිදු නොකර, අවශ්‍ය අවස්ථාවන්වලදී එවැනි අළුත්වැඩියා කිරීම ඉදිරි වර්ෂයන් සඳහා කල් තැබූ බැවින්ද මෙම ප්‍රතිපාදන ඉතිරි වූ බව. |
| (ආ) සමාලෝචිත වර්ෂයේදී මූලධන වැය විෂයයන් 03 ක් හා පුනරාවර්තන වැය විෂයයක් සඳහා රු.මිලියන 35.39 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු රු.මිලියන 27.43 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය සලසා තිබුණු ශුද්ධ | -එම- | වෙනත් සේවාස්ථාන කරා මාරු වී ගිය නිලධාරීන්ගේ දේපළ ණය පොලි මුදල ගෙවීමට අවශ්‍ය නොවීම, ජාතික අයවැය චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව රාජ්‍ය වියදම් අවම කිරීමට කටයුතු කළබැවින් සමාලෝචිත වර්ෂය තුළදී දේශීය හා විදේශීය පුහුණු වැඩමුළු සඳහා |

| | | |
|---|---|---|
| ප්‍රතිපාදනයෙන් සියයට 25.65 ක සිට සියයට 98.23 ක පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | | කාර්යමණ්ඩල දිරිගැන්වීම සිදු නොකිරීම හා වෙනත් මූලධන වියදම් සහ ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ සඳහා වියදම් දැරීමට සැලසුම් කළද ජාතික අයවැය චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව රාජ්‍ය වියදම් දැරීම සීමා කිරීමට සිදු වූ බව. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අප්‍රේල් 27 දිනැති අංක 155/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02(ඇ) ඡේදය ප්‍රකාරව යම් මුදල් වර්ෂයකට අදාළ සියළුම බැරකම් එම වර්ෂ තුළදී නිදහස් කළ යුතු අතර කිසිදු බැරකමක් ඊළඟ වර්ෂය තුළ නිරවුල් කිරීමේ අපේක්ෂාව ඇතිව ඉදිරියට ගෙන නොයා යුතුය. එම උපදෙස්වලට පටහැනිව දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට වැය විෂයයන් 06 ක් යටතේ එකතුව රු.322,461.39 ක බැරකම්වලට එළඹ තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවීම. | 2019 ඔක්තෝබර් 15 දිනැති අංක 269/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 4.11 ඡේදය පරිදි බැරකම් හා බැඳීම් විස්තර එක් එක් වියදම් ශීර්ෂ විසින් මු.රෙ. 94(1) ට අනුකූලව CIGAS පරිගණක වැඩසටහන මඟින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට වාර්තා කළයුතු වන අතර , එසේ වාර්තා නොකරන ලද කිසිදු බැඳීමක් හෝ බැරකමක් 2020 වර්ෂය තුල නිරවුල් නොකල යුතු බව සඳහන්ව ඇති හෙයින් අදාල බැරකම් CIGAS පරිගණක වැඩසටහනට ඇතුලත් කර ඇති බව.<br><br>මු.රෙ.115 අනුව පසුගිය වසරට අදාලව බැරකම් වලට බැඳීමට මාර්තු මස 31 දක්වා හැකියාව ඇති අතර, ප්‍රායෝගික වශයෙන් උද්ගත වන ගැටළු මත යම් මුදල් වර්ෂයකට අදාල බැරකම් අනුමැතියක් සහිතව ඉදිරි මුදල් වර්ෂයට ගෙන යාමට සිදුවන බව හා බැරකම් පිළිබඳ විස්තර ප්‍රකාශය වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

## 3.1 කාර්යසාධනය

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ක්‍රියාකාරී සැලැස්ම තුල දෙපාර්තමේන්තු ගාස්තු හා අයකිරීම් සමාලෝචනය කිරීමට අදාලව දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම හා යාවත්කාලීන කිරීම ඇතුළත් වන අතර මීට අදාලව විගණනයට MS-excel මඟින් දත්ත යාවත්කාලීන කිරීම සිදුකරන බව දන්වා එහි පිටපතක් ලබාදෙන ලදී. එම පිටපත ගාස්තු හා අය කිරීම සංශෝධනයන් කිරීමට අදාලව ලැබෙන ලිපි පිළිබඳ තොරතුරු පවත්වාගෙන යනු ලබන ලේඛනයක් වන අතර ඒ තුලින් ගාස්තු හා අයකිරීම් පිළිබඳ දත්ත පද්ධතියක් (Database) පවත්වාගෙන යාමක් හෝ සමාලෝචනය කිරීමක් සිදුකල නොහැකි බව විගණනයට නිරීක්ෂණය විය. | ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කළ යුතුවීම. | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබාදීමට ප්‍රථම එම ආයතන විසින් සපයා ඇති තොරතුරු ප්‍රමාණවත් නොවන්නේ නම් නැවත එම ආයතන වෙතින් කරුණු පැහැදිලි කරගෙන භාණ්ඩාගාර අනුමැතිය ලබාදීමට කටයුතු කරන බව, මෙම දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාකාරී සැලැස්මේ **Update Data Base** යනුවෙන් සඳහන් කර ඇත්තේ රාජ්‍ය ආයතනවලින් ලැබෙන තොරතුරු ක්‍රමවත්ව **MS-Excel** මඟින් පවත්වාගෙන යනු ලබන පරිගණක සටහන් සම්බන්ධයෙන් වන බව, දත්ත ගාස්තු පිළිබඳ අවශ්‍ය තොරතුරු **MS-Excel** පවත්වාගෙන යනු ලබන දත්ත ගොනුව මඟින් අධ්‍යයනය කිරීමට පහසු වන ආකාරයට සකස් කරන බව හා එසේ නොමැතිව කිසියම් ආයතනයකට මුදල් ගෙවා විශේෂ පරිගණක පද්ධතියක් සකස් කිරීමේ අවශ්‍යතාවයක් මෙම දෙපාර්තමේන්තුවට නොමැති බව. |
| (ආ) | අරමුදල් කළමනාකරණයට අදාල කටයුතු අධීක්ෂණය කිරීම හා අරමුදල් කළමනාකරණයට අදාල ප්‍රතිපත්ති මාර්ගෝපදේශයක් සකස් කිරීම ක්‍රියාකාරී සැලැස්ම අනුව | -එම- | අරමුදල් 9 ක් වසා ඉතිරි අරමුදල් වසාදැමීමට කටයුතු කරමින් පවතින බව |

| | | | |
|---|---|---|---|
| | දෙපාර්තමේන්තුව සතු කාර්යයන් වේ. ඒ අනුව 2017 මාර්තු 31 දින ඉදිරිපත් කළ ව්‍යවස්ථාපිත, ව්‍යවස්ථාපිත නොවන අරමුදල් හා භාර අරමුදල් සමාලෝචන වාර්තාව හා ඊට අදාලව දෙපාර්තමේන්තුව නිකුත් කළ 2018 අගෝස්තු 18 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව අරමුදල් 13 ක් වසා දැමීමට නිර්දේශ කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි. දෙපාර්තමේන්තුවේ විගණනයට ඉදිරිපත් කළ වර්තමාන ප්‍රගතිය අනුව 2020 සැප්තැම්බර් 22 දින වන විට අරමුදල් 05 ක් පමණක් වසා දැමීමට පියවර ගෙන ඇති බවත්, අරමුදල් 08 ක් වසා දැමීමට කටයුතු සිදුකෙරෙමින් පවතින බවත් නිරීක්ෂණය විය. | | |
| (ඇ) | 2019 ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රධාන කාර්යයන් තුළ අරමුදල් කළමනාකරණ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ සංවර්ධනය කිරීම උදෙසා අරමුදල් කළමනාකරණ මාර්ගෝපදේශ සකස් කරන බව දක්වා තිබූ නමුත් අරමුදල් කළමනාකරණ මාර්ගෝපදේශය 2019 වර්ෂය අවසාන වනවිටත් සකස් කර නොමැති බව නිරීක්ෂණය විය. | -එම- | රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ නිකුත් කිරීම සඳහා සකස් කිරීමට කටයුතු කල මාර්ගෝපදේශ අතර අරමුදල් කළමනාකරණ මාර්ගෝපදේශය වූ අතර 2019 නොවැම්බර් 26 දිනැති දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන්ගේ රැස්වීමේදී භාණ්ඩාගාර ලේකම්ගෙන් ලද උපදෙස් අනුව මෙම කාර්යය තාවකාලිකව අත්හිටුවීමට කටයුතු කරන බවට වාර්තා කර ඇත. |

| | | |
|---|---|---|
| (ඇ) 2015 අයවැය යෝජනාවක් මත ආරම්භ කෙරුණු රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත කෙටුම්පත් කිරීම වසර ගණනාවක සිට නව මුහුණුවරකින් හා රජයේ මුදල් වැය කරමින් ආරම්භ කළද, එය 2019 වසර අවසාන වනතුරු නිම කර නොමැති බව නිරීක්ෂණය විය. | -එම- | දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික ප්‍රධානීන්ගේ රැස්වීමේදී භාණ්ඩාගාර ලේකම්ගෙන් ලද උපදෙස් අනුව මෙම කටයුත්ත තාවකාලිකව අත්හිටුවන බවත් රාජ්‍ය මූල්‍ය සම්බන්ධව සකස් කරන ලද සියළුම චක්‍රලේඛ අවලංගු කර එම කරුණු සංගෘහිත කරමින් හා මුදල් රෙගුලාසි සඳහා අවශ්‍ය කාලීන සංශෝධනයන්ද කරමින් 9/2020 හා 02/2020 චක්‍රලේඛ නිකුත් කරන ලද බවත් දන්වා ඇත. |

## 3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 ජනවාරි 24 දිනැති 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව 2019 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් අදාළ ආකෘතියට අනුව සකස් කර නොතිබුණු නමුත් කාර්යසාධන වාර්තාව 2019 හි අනුකූලතා වාර්තාවේ "අනුකූලවේ" ලෙස සඳහන් කර තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවීම. | විගණන නිරීක්ෂණ හා එකඟ වෙමි. චක්‍රලේඛය ප්‍රකාරව 2019 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්ම අදාල ආකෘතියට අනුව සකස් කර තිබීම කාර්යසාධන වාර්තාව "අනුකූලවේ" ලෙස සඳහන් කර තිබුණේ වැරදීමකින් වන අතර "අනුකූල නොවේ" ලෙස නිවැරදි විය යුතු බවත් 2020 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකසා ඇති බවත් |
| (ආ) එක් එක් නිලධාරීන් වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණු නමුත් කාර්යසාධන වාර්තාව 2019 හි අනුකූලතා වාර්තාවේ "අනුකූලවේ" ලෙස සඳහන් කර තිබුණි. | -එම- | 02/2018 චක්‍රලේඛයේ පරිදි ආයතනයට සුදුසු ලෙස සකස් කර ගනු ලබන කාර්යසාධන ආකෘතියට අනුව ආයතනයේ සේවයේ නියුතු සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම ලෙස සඳහන් කරනු ලබන්නේ වාර්ෂිකව එක් එක් නිලධාරියා විසින් ප්‍රමාණකරුගේ හා ඇගයීම්කරුගේ |

| | | |
|---|---|---|
| | | අධීක්ෂණයට යටත්ව අත්සන් කරනු ලබන කාර්යසාධනය ලෙස සලකා “අනුකූල වේ” ලෙස සටහන් කර ඇත. එයට අමතර වෙනත් කාර්යසාධන ගිවිසුමක් අත්සන් කලයුතු වන්නේ නම් එම කාර්යසාධන වාර්තා අත්සන් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව |
| (ඇ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ලබාදිය යුතු වුවත් 64 ක් වන තත්‍ය සේවක සංඛ්‍යාවෙන් 23 දෙනෙකු සඳහා පමණක් පුහුණු අවස්ථා ලබා දී තිබුණු අතර 2019 කාර්යසාධන වාර්තාවෙහි වූ අනුකූලතා වාර්තාවේ “අනුකූල වේ” ලෙස සඳහන් කර තිබුණි. | -එම- | 2019 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් අදාල ආකෘතියට අනුකූලව සකසා නොතිබුණද එක් එක් නිලධාරියා වෙත එක් පුහුණු වැඩසටහනක් හෝ ලබාදීමේ අරමුණින් දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත. එහිදී විවිධ ආයතන මගින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලය දැනුවත් කරනු ලබන අතර කැමැත්තක් දක්වන හා පුහුණුව අදාල වන නිලධාරින් හට ඉල්ලුම් කිරීමේ හැකියාව ඇත. ඒ අනුව ඉල්ලුම් කළ සියළුම නිලධාරීන් හට පුහුණු අවස්ථා සලසා දී ඇත. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුවට අනුමත සේවක සංඛ්‍යාවෙන් තනතුරු 11 ක් පුරප්පාඩුව පවතින අතර එය අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 14.6 කි. මෙම පුරප්පාඩු තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 10 ක් පවතින අතර මෙම තනතුරු අඛණ්ඩව පුරප්පාඩු වී පැවතිනි. | අවශ්‍යතාවය අනුව පුරප්පාඩු පිරවීමට හෝ කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුවීම. | මෙම දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව 77 වන අතර, වර්තමාන පුරප්පාඩු 13 වේ. එම පුරප්පාඩු වලින් 12 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු වේ. මේ වන විට මුදල් අමාත්‍යාංශය මගින් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල සංශෝධනයක් සිදු කිරීමට කටයුතු කරමින් පවතින අතර, එම සංශෝධනය මගින් වර්තමානයේ පවතින පුරප්පාඩු පිරවීමට හැකි වනු ඇත. |